# WARNALEGAL
Justice for all

www.warnalegal.com




- FAMILY LAW
- MIGRATION LAW
- CONVEYANCING
- LITIGATION
- AUSTRALIAN LEGAL ADVICE
- SRI LANKAN LEGAL ADVICE
- COMMERCIAL & BUSINESS LAW
- POWERS OF ATTORNEY & WILLS
- ENGLISH/SINHALESE TRANSLATION & INTERPRETING SERVICE
- SRI LANKAN DEEDS & COMPANY REGISTRATION SERVICE

GUSS DESIGN 03 9769 0099



**Madhu Warnakulasuriya** *LL.B*
*Solicitor and Barrister*
*Registered Migration Agent*
*(MARN 1068979)*
*Attorney at Law in Sri Lanka*



Need Legal Help? Call us Now

**03 9792 9977**

Australia:
1/44 King Street
Dandenong VIC 3175
0432 480 133
+61 3 9792 9977
+61 3 9701 3718
info@warnalegal.com
warnalegal1

Sri Lanka:
01 Angampitiya Waikkala Sri Lanka
Hotline – 0776 120 008
031 22 72223  031 22 72223
warnalegal2@gmail.com
warnalegal2





## මේ නිමේෂය

දිනක් බුදුන් වහන්සේ සිය ශ්‍රාවකයන් අමතා මේ කතාව කීවා.

මිනිසෙක් කැලෑ බද කඳු පාරකින් යමින් සිටියා. එකවරම ඔහු ඉදිරියට දරුණු ව්‍යාඝ්‍රයෙක් ආවා. කරකියාගත හැකි යමක් නොතිබුණ තැන මිනිසා අසළ තිබූ මිදි වැලක එල්ලී ප්‍රපාතයට පැන්නා. එක අතකින් මිදි වැලේ එල්ලී සිටින මිනිසා පහළ බැලුවා. ප්‍රපාතයට පහළිනුත් තවත් ව්‍යාඝ්‍රයෙක්. ඉහළ සිටින ව්‍යාඝ්‍රයාටත් පහළ සිටින ව්‍යාඝ්‍රයාටත් මැදිවී මිදි වැලේ එල්ලී සිටින මිනිහා ඊළඟ'ට දැක්කෙ කලු සහ සුදු මීයන් දෙදෙනෙක් ටිකෙන් ටික මිදි වැල කපන ආකාරයයි.

ඒ අතරේ කඳු බෑවුමේ මිනිහා එල්ලී සිටින තැනට ළඟින් අපූරු ගඩා ගෙඩි රැසක් තිබුණා. ඔහු අත දිගු කර ඒවා එකින් එක කඩා ගනිමින් කන්නට වුණා.

"මේ පළතුරු කොයි තරම් රසවත්ද?" ඒ අතරේ මිනිසා තමන්ගෙන්ම අහගත්තා.

**මේ සෙන් කතාව මේ විදිහට තේරුම් කරගන්න පුලුවන්.**
**කලු සුදු මීයන් නම් දහවල සහ රාත්‍රියයි. ව්‍යාඝ්‍රයන් අප එදිනෙදා ජීවිතයේදී මුහුණ දෙන ආපදා ලෙඩ දුක් ප්‍රශ්න වැනි දේයි. ඒවා නියත මරණය පිලිබඳ සංකේතද වෙයි. මිනිසා මැදිවී සිටින මේ සියල්ල මැද ජීවිතයේ මේ මොහාත විඳ ගත යුතුයි.**

## නිශ්චිත ස්ථානය

සෙන් නෝරික්යූ ට කණුවක මල් කූඩයක් එල්ලන්නට අවශ්‍ය වුණා. ඔහු ඒ සඳහා වඩුවෙකුගේ සහය ලබා ගත්තා. වඩුවා කණුවේ තැනින් තැනට මල් කූඩය කබමින් එල්ලිය යුතු නිශ්චිත ස්ථානය ගැන නෝරික්යූ ගෙන් ඇසුවා.



"තව ටිකක් උඩට.. පෝඩ්ඩක් වමට.. ටිකාක් පහළට" ආදී වශයෙන් නෝරික්යූ ඉණිමගේ නැග ඉන්න වඩුවාට පහළ සිට උපදෙස් දුන්නා.

වඩුවාට හිතුණා මේ ආචාර්යවරයාව පොඩ්ඩක් පරීක්ෂා කර බලන්න. ඔහු ආචාර්යවරයාට නොපෙනෙන්නට නිශ්චිත ස්ථානය පැන්සලකින් ලකුණු කළා. ඉන්පස්සෙ මල් කූඩය වෙනම ස්ථානයක තබා ආචාර්යවරයාට කතා කළා.

"මෙතැන නේද හිමියනි?" ඔහු ඇසුවා.

"නැහැ නැහැ... " ආචාර්යවරයා කිව්වා. ඔහු නැවතත් වමට දකුණුට ඉහළට පහළට ආදී වශයෙන් කියමින් මල් කූඩය එල්ලිය යුතු තැන පෙන්වා දෙන්න පටන් ගත්තා. වඩුවා පුදුමයට පත් කරමින් නොරික්යූ දෙවන වතාවේ පෙන්නුවෙත් හරියටම කලින් වඩුවා පැන්සලෙන් ලකුණු කළ තැනමයි.

**බුද්ධිමත් මිනිසාගේ විනිශ්චය හැමවිටම එකක් බව තමයි අපට මේ කතාවෙන් තේරුම් ගන්න තියෙන්නෙ.**

ජගත්